60 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2009 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2009

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**
**வணிகக் கல்வியும் கணக்கீடும் II**
**Business and Accounting Studies II**

පැය තුනයි
*Three hour*

❖ පිළිතුරු ලිවීමේ දී පැහැදිලි අත් අකුරෙන් ලියන්න.

---

## I කොටස
### ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. කොළඹ පිටකොටුව බස් රථ ගාල, ගුණසිංහපුරයට මාරුකරනවාත් සමග බස් රථ හිමියන්ට ටයර් ටියබ් මාරුකිරිම හා ටයර් සවිකිරිම සඳහා 2Km ක් පමණ දුරක් කොළඹින් එළියට ඒමට සිදුවිය. එම ප්‍රදේශයේ ඉතා හොඳ සේවාවක් බස් රථ හිමියන්ට ලබා නොදීමත්, මිල වැඩි වීමත් නිසා කේන්තියට පත් සුරංජිත් අනගි සේවාවක් සපයමින් අඩු කාලයක් යටතේ අඩු මිලකට ටයර් ටියබ් මාරු කිරිම හා ටයර් සවිකිරිම සඳහා ලාභදායි ව්‍යාපාරයක් ආරම්භ කිරිමට ගුණසිංහ පුර ඔහුගේ මාමාගේ කුඩා කඩ කාමරයක් වාර්ෂික බද්දට ගෙන 2008.01.01 දින "අගනුවර ටයර් සර්විස්" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

තමාට හිමි පරණ කාරය රු. 500,000 කට විකුණා, මුලික තැන්පතුව රු. 100,000ක් මාමාට දුන් අතර ටයර් ගැලවීමේ උපකරණ රු. 200,000 ක් ගෙවා මිලදී ගෙන ඉතිරිය ව්‍යාපාරයට යොදවන ලදි. ටයර් ගැලවීමේ නවීන උපකරණයක් සම්පත් බැංකුවෙන් රු 150,000 ණය පදනම යටතේ මිලදී ගන්නා ලද අතර ඊලග වසර අවසානයේ ගෙවා දමන පෙරොන්දුව මත මාමාගේ කඩයේ පැවති රු. 25,000 ක්වටිනා ලි බඩු උපකරණ ණයට ඉල්ලා ගන්නා ලදි.

ටයර් ටියබ් මාරු කිරිම හා ටයර් සවිකිරිම සඳහා මෙසේ ඇරඹූ වෙළෙඳ සැල වසර අවසානයේ දී ලැබූ මුළු ආදායම රු 220,000 ක් ද මුළු වියදම ගෙවූ පොලියත් සමග රු. 160,000 ක් ද ලෙස පෙන්වන ලදි.

(i) සුරංජිත් තම ව්‍යාපාර අදහස මතු කර ගැනීමට පදනම් කරගත් හේතු දෙකක් දක්වන්න.
(ii) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයට අයත් වේ ද?
(iii) ඔහුගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? හේතු දක්වන්න.
(iv) සුරංජිත් ගේ ව්‍යාපාරය සඳහා සුදුසු "දැක්මක්" (Vision) ගොඩ නගන්න.
(v) ව්‍යාපාරයේ 2008.12.31 දිනට මුළු බාහිර වගකීම්වල වටිනාකම කොපමණද?
(vi) මෙම ව්‍යාපාරයේ 2008.12.31 දිනට මුළු වත්කම් වල වටිනාකම කොපමණද?
(vii) 2008.12.31 දිනට මෙම ව්‍යාපාරය සතු අත ඉතිරි මුදල් කොපමණද ?
(viii) මෙම ව්‍යාපාරයේ 2008.12.31 දිනට ප්‍රාග්ධනය කීයද ?
(ix) මෙම ව්‍යාපාරය මගින් බිහිවිය හැකි වෙනත් ව්‍යාපාරික අවස්ථා දෙකක් යෝජනා කරන්න.
(x) මෙම ව්‍යාපාරය තව දුරටත් පුළුල් කිරිමේ දි සංවිධානාත්මක හා ප්‍රාග්ධන දුස්කරතා මගහරවා ගැනීමට ඔබ කරන යෝජනා මොනවාද ?

(ලකුණු 2 x 10 = 20)

## II කොටස A - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) රටක දළ දේශීය නිෂ්පාදිතය,

    1. ගණනය කරන්නේ කොතරම් කාලච්ඡේදයකට ද?
    2. කිනම් සාධක පදනම් කරගෙනද ?

(ii) අවශ්‍යතා හා වුවමනා වෙන වෙනම නිර්වචනය කරන්න.

(iii) ඍජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) සාර්ව පරිසර හා සූක්ෂම පරිසර 2 බැගින් වෙන වෙනම ලියන්න.

(v) W5 රාමුව නම් කරන්න.

(ලකුණු 2 x 5 = 10)

03. (i) වාණිජ බැංකුවකින් ලබා ගත හැකි සේවා 4ක් ලියන්න.

(ii) සී/ස සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා නව සමාගම් පනතට අනුව සමාගම් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්තුමාට ලබා දිය යුතු ලියවිලි 4ක් නම් කරන්න.

(iii) පහත ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා ගත යුතු ආයතන නම් කරන්න.

- ඉංග්‍රීසි බෙහෙත් අළෙවි සල
- කර්මාන්ත ශාලා
- වාණිජ බැංකු
- මුද්‍රණ හා ප්‍රකාශණ

(iv) ව්‍යාපාර සඳහා දායක වන උපකාරක සේවා 4 ක් නම් කරන්න.

(v) මෑතකදී රජයට පැවරුණු රක්ෂණ ආයතනය කුමක්ද ? එය පැවරුවේ කවුරුන් විසින් ද?

(ලකුණු 2 x 5 = 10)

## II කොටස B - ගිණුම්කරණ අධ්‍යයනය

04. (i) පහත දැක්වෙන්නේ 2008.12.31 දිනට වත්කම්, වගකීම් ශේෂ කිහිපයකි. ඒවා පොදු ජ'නලයේ ලියා දක්වන්න.

| | |
|---|---:|
| ඉඩම් ගොඩනැගිලි | 580,000 |
| බැංකු ණය | 230,000 |
| ණය ගැතියෝ | 120,000 |
| යන්ත්‍ර සූත්‍ර | 265,000 |
| මුදල් ශේෂය | 35,000 |
| ණයහිමියෝ | 170,000 |

(ii) 2009 ජූනි මාසයේ "ජයටැඹ" ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුව හා බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශණය පහත දැක්වේ. මුදල් පොත පොත සංශෝධනය බැංකු සැසඳුම් පතක් පිළියල කරන්න.

**මුදල් පොත**

| | | | |
|---|---:|---|---:|
| ශේෂය ඉ/ගෙ | 66,135 | රශ්මි (චෙ.අ. 11150) | 11,632 |
| මලිෂා (චෙ.අ. 1050) | 18,000 | දුලාජ් (චෙ.අ. 11151) | 4,512 |
| සදනි (චෙ.අ. 7055) | 7,365 | පියුමි (චෙ.අ. 11152) | 6,892 |
| තුෂාර (චෙ.අ. 8111) | 12,115 | ඉසුරි (චෙ.අ. 11153) | 15,334 |
| මල්ෂ (චෙ.අ. 0256) | 19,735 | ශේෂය ප/ගෙ | 84,980 |
| | 123,350 | | 123,350 |
| ශේෂය ඉ/ගෙ | 84,980 | | |

**බැංකු ප්‍රකාශණය**

| විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| ශේෂය | | | 66,135 |
| චෙක්පත (චෙ.අ. 7055) | | 7,365 | 73,500 |
| ස්ථාවර නියෝග - රක්‍ෂණ වාරිකය | 6,000 | | 67,500 |
| චෙක්පත - පවනි | | 15,000 | 82,500 |
| චෙක්පත (චෙ. අ. 11150) | 11,632 | | 70,868 |
| චෙක්පත (චෙ.අ. 8111) | | 12,115 | 82,983 |
| චෙක්පත (චෙ. අ. 11152) | 6,892 | | 76,091 |
| බැංකු ගාස්තු | 250 | | 75841 |
| චෙක්පොත් ගාස්තු | 300 | | 75,541 |

(ලකුණු 10)

05. (i) පහත ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

1. අයිතිකරු ප්‍රාග්ධනය යෙදුවා රු. 300,000
2. අත්පිට විකුණුම් රු. 180,000
3. යන්ත්‍රයක් මිලට ගත්තා රු. 60,000
4. සංග්‍රහ ගාස්තු ගෙව්වා රු. 3,000
5. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා රු. 4,000
6. ණයට ගෘහභාණ්ඩ ගත්තා රු. 16,000
7. ලැබූ ගෙවල් කුලිය රු. 8,000
8. බැංකු ණය පොලිය ගෙව්වා රු. 7,500
9. ණය හිමියන්ට මුදල් ගෙව්වා රු. 4,100
10. රු. 100,000 ක් වටිනා තම ලී බඩු ව්‍යාපාරයට යෙදුවා.

(ii) චම්පා ඇඟළුම් නිෂ්පාදන ආයතනයක් ප්‍රසිද්ධ නගරයක ආරම්භ කළ අයෙකි. ඇයට පළමු මාසයේ ඒ සඳහා මසකට රු. 20,000කට කුලියට ගොඩනැගිල්ලක් ලබා ගැනීමට සිදුවිය. තවද රෙදි මිලදී ගැනිම සඳහා රු. 40,000 ක් ද, නූල් හා අනෙකුත් ද්‍රව්‍ය සඳහා රු. 10,000 ක් ද මසකට විදුලිය ගාස්තු රු. 4,000 ක්ද මුරකරු වැටුප් රු. 7,000 ක්ද ගෙවීමට සිදුවිය. ඇදුම් මසන්නාට මසකට රු 15,000 ක් ගෙවනු ලැබේ. පළමු මාසයේ නිපදවන ලද මුළු ඇඟළුම් ගණන 100 කි.

(i) මෙම තොරතුරු අනුව පළමු මාසයේ මුළු නිෂ්පාදන පිරිවැය සොයන්න.
(ii) එක් ඇඟළුමක් නිෂ්පාදනයට ගිය පිරිවැය කියද?
(iii) 30% ලාභයක් අපේක්‍ෂා කරයි නම් එක් ඇගළුමක් විකිණිය යුතු මිල කියද ?

(ලකුණු 10)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.